**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය - 2018**

**-----------------------------------------------**

**තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ (“විශ්වවිද්‍යාලය”) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංත 38 දරන මුදල් පනතේ විධානයන් යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ

පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම්

| අදාල ප්‍රමිත වලට අනුකූල නොවීම් සඳහා යොමුව | කලමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි එකට අත්පත් කර ගත්තද වටිනාකම වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කළ යුතුයි. කෙසේ වුවද, 2018 දෙසැම්බර් 31 දිනට රු. 2,712,073,167 ක් වූ විශ්ව විද්‍යාලයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම වෙන් වෙන්ව නොදක්වා එකට ගිණුම්ගත කර තිබුණි. | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම් වල අයිතිය ලබාගැනීමේ හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කිරීමේ ක්‍රියාවලිය මේ වන විට සිදුකරමින් පවති. එම ක්‍රියාවලිය අවසන් වූ වහාම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ප්‍රත්‍යාගණන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරවු කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කලමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| (අ)විශ්වවිද්‍යාලට අයත් හෙක්ටයාර 210.3 ක් විශාල ඉඩම් 11 ක හා එහි ඇති ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම් වල අයිතිය ලබාගැනීමේ හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කිරීමේ ක්‍රියාවලිය මේ වන විට සිදුකරමින් පවති. එම ක්‍රියාවලිය අවසන් වූ වහාම ප්‍රත්‍යාගණන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරවු කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය අදාල ආයතන මගින් සිදුකිරීමට හා ඉඩම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)ත්‍රිකුණාමල විශ්වවිද්‍යාලයේ සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යන පීඨයේ ඉදිකළ මහල් 5 න් සමන්විත ගොඩනැගිල්ල හා ශ්‍රවණාගාර ගොඩනැගිල්ල සඳහා රු. මිලියන 75 ක් ගෙවා තිබුණද එම වටිනාකම කෙරීගෙන යන වැඩ වටිනාකම තුල දක්වා නොතිබුණි. | මෙම රු.මිලියන 75 ක මුදල ඉදිකිරීම් ව්‍යාපෘතිය ආරම්භයේ ලබා දෙනු ලබන 10% වන වැඩ ආරම්භක අත්තිකාරමක් ලෙස ගෙවන ලදී. එබැවින් මෙය ආරම්භක අත්තිකාරමක් ලෙස සැලකන ලද අතර එය ගිණුම්වල ණයගැතියන් ලෙස පෙන්වන ලදී. (කරුණාකර 2018 මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 22 බලන්න) | මූල්‍ය ප්‍රකාශනවල වර්ගීකරණ දෝෂ මගහරවා ගැනීම සඳහා ප්‍රගති වාර්තා සලකා බැලීමට අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) 2018 වර්ෂයේ පශ්චාත් උපාධි පර්යේෂණ හා ශිෂ්‍යත්ව සඳහා අධ්‍යන කාර්ය මණ්ඩලය වෙත රු.506,258 ක් ගෙවා තිබුණි. කෙසේවුවත්, එම අගය අස්පෘෂ්‍ය වත්කම් ලෙස දැක්වීම වෙනුවට මෙහෙයුම් වියදම් ලෙස දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන වල වර්ගීකරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ)මූල්‍ය ප්‍රකාශන වලට අනුව සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයෙන් හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබිය යුතු ලෙස පිළිවෙලින් රු. 9,751,892 ක් හා රු. 1,408,946 ක් දක්වා තිබුණි. කෙසේවෙතත්, මෙම ශේෂයන් අදාල ආයතන වල මූල්‍ය ප්‍රකාශන වල විශ්වවිද්‍යාලයට ගෙවියයුතු අගයක් ලෙස දක්වා නොතිබුණි. එබැවින් ඉහත ශේෂයන්ගේ නිවැරදිභාවය හා අයකරගතහැකිභාවය විගණනයේදී සත්‍යාපනය නොවිය. | මූල්‍ය ප්‍රකාශන වලට අනුව සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයෙන් හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබිය යුතු ලෙස පිළිවෙලින් රු. 9,751,892 ක් හා රු. 1,408,946 ක් දක්වා තිබුණි. මෙම අගයන් පසුගිය වර්ෂවල සිට ඉදිරියට ගෙන එන ලද අගයන් වේ. පොත්වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලැබේ. | සුදුසු ගිණුම්කරණ ක්‍රමවේදයක් යොදාගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඉ)පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල රු. 9,400,000 ක් ලෙස දැක්වූ මාර්ගස්ථ මුදල් වටිනාකම රු. 9,300,319 ක් ලෙස විවිධ ණයගැතියන් ලෙස වෙනස් වී තිබුණි. කෙසේ වුවද, ඉහත පෙර ශේෂය වෙනස්වීමට අදාලව කිසිදු සාක්ෂියක් විශ්වවිද්‍යාලය මගින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම රු. 9,400,000 ක මුදල හාහිර අධ්‍යානවලට ගෙවියයුතු අගයක් වන අතර එය 2002 වර්ෂයේදී හාහිර අධ්‍යාන අංශයෙන් ලබා ගත් මුදලක් වන අතර එය පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මාර්ගස්ථ මුදල් ලෙස වැරදීමකින් දක්වා තිබුණි. | ගිණුම්කරන දෝෂ නිවැරදි කිරීමට හා කාරණය කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතුය. |
| (ඊ)ත්‍රිකුණාමලය විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂය අවසානයේ වාහන හා තොරතුරු තාක්ෂණ සංවර්ධන අංශයේ ක්ෂය ප්‍රමාණය රු. 8,818,186 ක් විය.කෙසේවුවද මූල්‍ය ප්‍රකාශන වල එම අගය රු. 4,641,750 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල මෙම වත්කම් වල අගය රු. 4,176,436 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව 2017 වර්ෂයේදී සියළුම වාහන ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර තිබේ. මෙම කාරණය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. . | මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දැක්වූ අගය නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **කලමනාකරණයේ අදහස් දැක්වීම නිර්දේශය නිර්දේශය** | |
|---|---|---|
| (අ) පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වූ ස්ථාවර වත්කම් අවසාන ශේෂය වූ රු.3,279,124,194 ක අගය සමාලෝචිත වර්ෂයේ රු. 3,273,604,684 ක් ලෙස ආරම්භක ශේෂය ඉදිරියට ගෙනවිත් තිබීම හේතුවෙන් රු. 5,519,510 ක වෙනසක් මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරන ලදී. | පෙර වර්ෂයේ අලාභ හා ගෙවිය යුතු රඳවාගත් මුදල් නිසා මෙය ඇතිවී තිබේ. | ස්ථාවර වත්කම් ශේෂය සැසඳීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ)මූලා ප්‍රකාශන අනුව උපකුලපති අරමුදලේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට රු. 2,194,647 ක් විය. නමුත් මූලා ප්‍රකාශන සඳහා ලබාදෙන ලද උපලේඛණ අනුව එම අරමුදල රු. 2,340,078 ක් විය. මේ හේතුවෙන් රු. 145,431 ක විස්තර නොකළ වෙනසක් නිරූපනය විය. | මෙහෙයුම් සම්බන්ධ ගැටළු හේතුවෙන් අතීතයේ උපකුලපති අරමුදල ක්‍රියාත්මක නොවූ බැවින් සමහර ගණුදෙනු උපකුලපති අරමුදලින් දැරීම වෙනුවට පුනරාවර්තන ගිණුමෙන් දරණ ලදී. එබැවින් මෙම වෙනස සිදුවී ඇති අතර එය ඊලඟ වර්ෂයේ ගිණුම්වල ගැලපීමට කටයුතු කරනු ලැබේ. | මෙම අරමුදලේ ශේෂය සැසඳීමට කටයුතු කළ යුතු වේ. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂයට අදාලව රු. 230,328,305 ක් වන පහත ගිණුම් අයිතම 02 කට ශේසයන් සඳහා එහි ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| අයිතමය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකළ සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| විවිධ ණය හිමියෝ | 35,097,491 | ශේෂ තහවුරුව සහ කාල විශ්ලේෂණය | | |
| විවිධ ණය ගැතියෝ | 195,230,814 | ශේෂ තහවුරුව සහ කාල විශ්ලේෂණය | අවශ්‍ය විස්තර සැපයීමට කටයුතු කරනු ලැබේ. | මූලා ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| ඉඩම් හා ගොඩනැගිලි | 4,327,479,889 | ස්ථාවර වත්කම් ලේඛණය, විස්තරාත්මක උපලේඛණ හා ආරම්භක ශේෂ වලට ආදාල තොග සමීක්ෂණ වාර්තා | | |

## 1.6 ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 1 සිට 15 ක කාලයකට අදාලව ආචාර්යවරුන් 73 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම් හේතුවෙන් අයකරගතයුතු රු.173,439,127 ක මුදල අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | බැඳුම්කර පැහැර හැරීම් 12 ක් ඇතුළුව 74 ක් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හා අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට බාරදී ඇත. නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | පැහැරහැරීම් අයකරගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වේ. |

### 1.6.2 ගෙවියයුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 765,844 වන රඳවාගැනීම් බද්ද, එකතු කළ අගය මත බද්ද, හා ව්‍යාපාර ආදායම් බද්ද වසර 10 කට වඩා වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අතර 2019 මැයි දක්වා නියමිත ආයතන වලට ප්‍රේෂණය කර නොතිබුණි. | මෙම අගය 1998 වර්ෂයේ සිට දිගින් දිගටම එකතු වී ඉදිරියට ගෙනඑන ලද අගයක් වන අතර මේ සම්බන්ධ තොරතුරුද ආයතනය සතුව නොමැත. අදාල ආයතන වල අනුමැතියද සහිතව පොත්වලින් ඉවත්කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල අධිකාරීන්ගේ අනුමැතිය සහිතව විසඳීහට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.3 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය මගින් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය සඳහා විවිධ අරමුණු වලට ලබා දෙන ලද සුළු මුදල් අත්තිකාරම් අගය රු.73,440 ක් විය. කෙසේවුවත් මෙම වාර්තාවේ දිනය දක්වාම එම වටිනාකම පියවා නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 දින දක්වා දක්වා නොපියවූ සුළු මුදල් වල අගය රු. 73,439 ක් වන අතර එය පියවීමට කටයුතු කරනු ලැබේ. | අත්තිකාරම් අප්‍රමාදව පියවීමට කටයුතු කළ යුතු වේ. |

**1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.**

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 757 (2) | සමාලෝචිත වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව 2019 මැයි 22 දින දක්වාම විගණකාධිපතිවරයා ට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) අංක 3/2015 හා 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | තත්කාර්ය අතුරු අග්‍රිම උපරිම සීමාව වන රු.100,000 ඉක්මවා අවස්ථා 08 කදී නිලධාරීන් තිදෙනෙකුට රු.1,497,812 ක් සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි. | සත්‍ය වශයෙන්ම වන අවශ්‍යතාවය මත පදනම්ව නිසි අනුමැතිය සමග මුදල් නිකුත් කර ඇති අතර සියළුම මුදල් නියමිත කාලයේදී පියවා ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව නියමිත සීමාවන්ට යටත්ව අත්තිකාරම් ලබාදීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) ජාතික පුස්තකාල හා ලේඛණාරක්ෂක සේවා මණ්ඩලයේ අංක 2004/lib./01 හා 2004 | මූල්‍ය ප්‍රකාශන අනුව රු. 94,437,278 ක් වූ පුස්තකාල පොත් හා සහරා සම්බන්ධ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2019 මැයි 22 දින දක්වාම විගණනයට ඉදිරිපත් කර | පුස්තකාලය සතුව වර්තමානයේ රු.89,000 ක පොත් හා සහරා තිබේ. තවද වාර්ෂික තොග සමීක්ෂණ ක්‍රියාවලිය | පුස්තකාල පොත් හා සහරා සඳහා කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අප්‍රමාදව |

| | | | |
|---|---|---|---|
| ජනවාරි 26 දිනැති චක්‍රලේඛය | නොතිබුණි | සෙමෙස්තර ආකාරයෙන් පැවැත්වෙන් අධ්‍යාන වැඩසටහන් සඳහා බලපානු ලබයි. කෙසේවුවත්, සමීක්ෂණ මණ්ඩල පත්කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 345,563,842 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 334,815,279 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,748,563 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පෞද්ගලික පඩිනඩි වියදම රු .208,069,613 න් හා ක්ෂය හා ක්‍රමක්ෂය වියදම රු.61,899,201 න් ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

----------------------------------------------------------------------

මෙම ආයතනයේ ප්‍රධාන ආදායම හා වියදම ලෙස භාණ්ඩාගාර ප්‍රදාන හා සේවක පාරිශ්‍රමික දැක්විය හැක. සමාලෝචිත වර්ෂයේ සේවක පාරිශ්‍රමික වියදම රු. 899,303,660 සිට රු.1,107,373,273 ක් දක්වා වැඩිවී ඇති අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී 23 % ක වැඩිවීමකි.

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රදාන රු. 1,193,688,000 සිට රු. 1,477,100,000ක් දක්වා වැඩිවී ඇති අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී 23 % ක වැඩිවීමකි.

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු. 1,331,144,325 සිට රු. 1,688,086,453 ක් දක්වා වැඩිවී ඇති අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී 27 % ක වැඩිවීමකි.

එසේම සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ සේවක පාරිශ්‍රමික වියදම, මෙහෙයුම් ආදායම සමග සැසඳීමේදී පිළිවෙලින් මෙහෙයුම් ආදායමෙන් 65% ක් හා 67% ක් සේවක පාරිශ්‍රමික සඳහා පමණක් වියදම් දරා ඇති බව අනාවරණය විය.

## 2.3 අනුපාත විශ්ලේෂණය

------------------------

සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ ජංගම අනුපාතය පිළිවෙලින් 3.6:1 ක් හා 2.7:1 ක් වූ අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී 33% ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i) නැගෙනහිර විශ්වවිද්‍යාලය මගින් කථිකාචාර්ය (පරිවාස) තනතුරට එක් අයදුම්කරුවකු බඳවාගත් අතර බඳවාගැනීමේ ක්‍රියාවලියේ සිදුවූ අවිධිමත්භාවයන් හේතුවෙන් විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය මගින් එම පත්කිරීම අවලංගු කරන ලෙස නියෝග කර තිබුණද එම විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ නියෝගය ක්‍රියාත්මක කිරීමට එරෙහිව අභියාචනාධිකරණයෙන් 2005 මැයි 10 සිට 2005 ජුනි 13 දක්වා වලංගුවන අයුරින් අත්හිටුවීමේ නියෝගයක් නිකුත්කර තිබුණි. ඉහත අත්හිටුවීමේ නියෝගය කල් ඉකුත්වීම නොසලකා ඉහත කථිකාචාර්යවරයා තනතුරෙහි ස්ථිර කර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස් කර වාහන බදුරහිත බලපත්‍රයක් හා දර්ශනපති (PhD) අධ්‍යනය සඳහා වැටුප් සහිතව ශිෂ්‍යත්වයක්ද ප්‍රදානය කර තිබුණි. | අවශ්‍ය සියළුම ගුණාංග, සුදුසුකම් හා කාර්යසාධනය සලකා බලා සුදුසු පුද්ගලයාව තේරීම් කමිටුව මගින් තෝරාගෙන තිබුණි.<br><br>නියෝග අංක 384/2005 මගින් අභියාචනාධිකරණය මගින් අත්හිටුවීමේ නියෝගයක් නිකුත් කරන ලදී. පසුව විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ II කොටසේ 27.3 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය මගින් ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා අධ්‍යන නිවාඩු ලබා දී ඇති අතර මෙම කථිකාචාර්යවරයාට අනුක්‍රමික ක්‍රමවේදයට බදු නිදහස් වාහන බලපත්‍රයක්ද ලබා දෙන ලදී. | විශ්වවිද්‍යාලයට සිදුවූ අලාභය මුදල් රෙගුලාසි 104 හා 105 ප්‍රකාරව ඉහත කථිකාචාර්යවරයා තෝරා ගැනීමට හා පත්කිරීමට වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | මෙම කථිකාචාර්යවරයා තම අධ්‍යන කටයුතු සම්පූර්ණ කර නොතිබූ අතර ඒ සඳහා වූ රු.4,545,418 ක බැඳුම්කරය අයකරගැනීමට වසර 2කට වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි. තවද එම කථිකාචාර්යවරයා බාහිර දේශකවරයකු ලෙසද පත්කර ඇති අතර ඒ වෙනුවෙන් රු.290,000 ක් ගෙවා තිබුණි. | 2016 දෙසැම්බර් 28 දින විධිමත් ක්‍රියාවලියක් තුලින් ඉහත කථිකාචාර්යවරයාට ලිපියක් යොමුකර ඇති අතර දැනට ඔහුගේ හාහිර දේශන නවත්වා ඇති අතර ගෙවීම්ද නතර කර තිබේ. | ඉහත කථිකාචාර්යවරයාගෙන් අදාල අයවියයුතු බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. ඉහත කථිකාචාර්යවරයා භාහිර දේශකයකු ලෙස පත්කරගැනීමට වගකිවයුතු නිලධාරීන්ට විරුද්ධව සුදුසු විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | මඩකලපුව දිස්ත්‍රික් උසාවියේ ඒකපාර්ශික ලස නඩුවක් ගොනුකර තිබූ අතර එහිදී පැමිණිකරුට රු.1,000,000 ක වන්දියක් ගෙවන ලෙස විශ්වවිද්‍යාලයට නියෝගකර තිබුණි. මෙම නියෝගයට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් රු.257,650 ක් නීති ගාස්තු ලෙස ගෙවා තිබුණි. | | |
| | කෙසේවුවත්, විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් මෙම නඩුව අත්හැර දැමීමට තීරණය කළ අතර අදාල පැමිණිලිකරුට වන්දි ලෙස විශ්වවිද්‍යාල අරමුදලින් රු.500,000 ක් ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | |
| (ii) | ත්‍රිකුණාමලය විශ්වවිද්‍යාලයේ හිටපු සභිකයකු (කළමනාකරණය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය) මූල්‍ය අක්‍රමිකතා හේතුවෙන් ඔහුගේ සේවය අවසන් කර වැඩ තහනම් කරන ලදී. සහන කමිටුවේ නිර්දේශ මත සියළුම වරප්‍රසාද ගෙවීමේ පදනම මත නැවත ඔහුව වැඩ තහනම් කරන ලද දිනයේ සිට වලංගු වන පරිදි සේවයේ පිහිටුවන ලදී. ඉහත කථිකාචාර්වවරයා 2018 ජනවාරි 27 දින සිට සේවයෙන් ඉල්ලා අස්වී ඇති අතර එදිනම කොළඹ නව රැකියාවකට බැඳී තිබුණි. 2019 දක්වා ඇති අනිවාර්ය සේවා බැඳීම හා බැඳුම්කරය නොසලකා සභාව විසින් ඔහුගේ | 2018 ජනවාරි 21 වන දින පැවති සභාවේ 283 වන රැස්වීම් වාරයේදී ඔහුගේ ඉල්ලා අස්වීමේ ලිපිය අනුමත කරන ලද්දේ එදින සිට මාසයක කාලයක් තුල ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු මුදල් පියවීමට යටත්වය. ඔහු විසින් එසේ නොකළ බැවින් ඔහුට විරුද්ධව නීතිමය ගෙන තිබේ. | මෙම කාරණය විසඳමට අප්‍රමාදව සුදුසු පියවරක් ගත යුතුවේ. |

ඉල්ලා අස්වීම පිළිගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය මගින් රු.11,563,675 ක් වියදම් දරා තිබුණි. කෙසේවුවත්, විනය පරීක්ෂණ ක්‍රියාවලියේ පවතින අඩුපාඩු සහ විශ්වවිද්‍යාලයේ පවතින අකටයුතු හේතුවෙන් මේ දක්වා ඉහත කාරණය නොවිසඳී තිබුණි.

## 3.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයට බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී 1948 සිට 1715 දක්වා එනම් සියයට 12 ක අඩුවීමක් දක්නට ලැබුණි.. | ශිෂ්‍ය ප්‍රතිපාදනය හෝ බඳවා ගැනීම් ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිදුකරනු ලබන අතර ශිෂ්‍ය සංඛ්‍යාවේ අඩුවීමට විවිධ හේතුක් බලපානු ලබන අතර එය අපගේ පාලනයෙන් බැහැර වූ දෙයක් වන අතර විශ්වවිද්‍යාලය මගින් සිසුන් බඳවා ගනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් වෙන්කරනු ලබන ප්‍රමාණයට පමණි. | ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීමට හේතු හඳුනාගැනීමට කටයුතු කළ යුතු අතර බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩිකර ගැනීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3.3 අරමුදල් ඌණ උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| Gender සමානතා හා සමානාත්මතා මධ්‍යස්ථාය හා පුස්තකාල **Cells Establishment of Reservation and Conservation Unit in Library** යනාදිය සඳහා පිළිවෙලින් රු. 1,000,000 ක් හා රු.1,000,000 ආධාර ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් | ව්‍යාපෘතියේ පහත කාර්යයන් සිදු කරමින් පවති.<br>ශිෂ්‍ය ක්‍රියාමාර්ග හේතුවෙන් ශිෂ්‍යයන් සඳහා වූ වැඩමුළු කිහිපයක් අවලංගු කිරීමට හා කල් දැමීමට සිදුවූ අතර පසුව සිසුන්ගේ සමාලෝචන පරිච්ඡේදය හා විභාගයන් සිදුවිය. එබැවින් එය පැවැත්වීමට නොහැකි විය. | ආධාර ලැබීම් අදාල කාර්ය සඳහා අප්‍රමාදව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| සභාවෙන් ලැබී තිබුණි. කෙසේවෙතත්, එම ප්‍රදාන උපයෝජනය කර නොතිබුණු අතර අදාල අරමුණ වෙනුවෙන් වසර 2කට වැඩි කාලයක් ගිණුම්වල දක්වා තිබුණි. | ප්‍රාග්ධන අයිතම වැනි මිලදී ගැනීම් සිදුකරමින් පවතී. ජාත්‍යන්තර ගැහැනු ළමුන්ගේ දිනය 2016 වර්ෂයේදී පවත්වන ලද අතර 2017 වර්ෂයෙන් පසු සැලසුම් කළද සිසුන් නොමැතිවීම නිසා පැවැත්විය නොහැකි විය. සියළුම කටයුතු නැවත ප්‍රතිව්‍යුහගත කළ යුතු වන අතර මුදල් ඉදිරියේදී උපයෝජනය කරනු ලැබේ. | |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ කලුවන්කර්නි කෘෂි විද්‍යා පීඨයට ප්‍රවේශවන මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව (අදියර 1) රු. 22,573,400 කට පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ. | | |
| • 2007 මැයි 04 දිනැති ප්‍රසම්පාදන අත්පොතේ 9 කොටසේ 5.3.5 වගන්තියට පටහැනිව ඉහත කොන්ත්‍රාත්තුව සඳහා ලංසුකරු තේරීම හා පිරිනැමීම සිදු කර තිබුණි. | ICTAD C 6 හෝ ඉහළ මට්ටම සමග ජාතික තරඟකාරී ලංසු ක්‍රමය හරහා මිලගණන් කැඳවන ලදී. එකම එක ලංසුකරුවකු පමණක් ප්‍රතිචාර දක්වා තිබුණු අතර ලංසු ලියවිලි අනුව සුදුසුකම් සපුරා ඇති කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. | ICTAD රීති හා රෙගුලාසි හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ඉදිකිරීම්වලට අදාල ලංසු ක්‍රමවේදය අනුගමනය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| • මඩකළපුව මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත ඉංජිනේරුවරයකු මෙම කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරුවකු ලෙස මෙන්ම මෙම කොන්ත්‍රාත්තුවේ | මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවයා තාක්ෂණික ඇගයීම් කමිටුවට පත්කර තිබුණද ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයා ලෙස පත්කර නොමැත. ශ්‍රී ලංකා | ප්‍රසම්පාදන හා ICTAD මාර්ගෝපදේශ අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයකු ලෙසද කටයුතු කරන බව නිරීක්ෂණය විය. | නැගෙනහිර විශ්ව විද්‍යාලයේ වැඩ ඉංජිනේරුවරයා මෙම ව්‍යාපෘතියේද ඉංජිනේරුවරයා වන අතර සෑම ගෙවීමකටම අදාල මිනුම් බිල්පත් ඔහු විසින් සහතික කරනු ලැබේ. | |
| • 2007 වර්ෂයේ ICTAD/SBD/14 දරන කොන්ත්‍රාත් කොන්දේසි 28 වන වගන්තිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.14.1 ට පටහැනිව අධාරක ලියවිලි නොමැතිව කොන්ත්‍රාත්කරුට තම කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා දෙවරක් කාලය දීර්ඝ කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.2 ප්‍රකාරව මෙම කාර්ය සඳහා ඉදිකිරීම් කාලය ලෙස සති 30 (මාස 7.5) ක් ලබා දිය හැකි වුවද මෙහි ඉක්මන් අවශ්‍යතාවය සලකා එහි කටයුතු මාසයක් තුල නිම කිරීමට තීරණය කරන ලද නමුත් මෙම ප්‍රදේශයට ලැබුණු අනපේක්ෂිත වර්ෂාව හා ගංවතුර හේතුවෙන් අප විසින් කාලය දීර්ඝ කිරීමක් සිදුකර ඇත. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) අනුමත ස්ථිර අධ්‍යන කාර්යමණ්ඩලය 284 ක් වන අතර සත්‍ය කාර්යමණ්ඩලය 204 වී තිබුණි. පුරප්පාඩු 80 න් 23ක්ම මහාචාර්ය තනතුරු වේ. අධ්‍යන කාර්යමණ්ඩලයේ පුරප්පඩු පැවතියද ආචාර්යවරුන් 04 ක් සප්තවාර්ෂික නිවාඩු ලබාගෙන තිබුණි. | 2012 සිට 2018 වර්ෂය අතරතුර විශ්වවිද්‍යාලය විසින් අවස්ථා කිහිපයකදී අධ්‍යන පුරප්පාඩු දැන්වීම් පළ කිරීමට කටයුතු කර තිබේ. කෙසේවුවද, කාර්යමණ්ඩල පුරප්පාඩු සඳහා පත්කිරීම් කර නොතිබුණි. | අප්‍රමාදව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 93 ක් විය. මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 876 ප්‍රකාරව සුළු සේවකයින් හා කළමනාකරණ සහකාර තනතුරු සඳහා වන බාහිර බඳවා ගැනීම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලැයිස්තුවක් ලබාගෙන සිදුකළයුතුය. එවැනි ලැයිස්තුවක් දැනට ලැබී නොමැති බැවින් මෙය සිදුකල නොහැකි වී ඇත. | අප්‍රමාදව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක PED/12 හා 2003 ජුනි 02 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ හා 01/2014 දරන මුදල් චක්‍රලේඛයේ සඳහන් සංයුක්ත සැලැස්මේ මගපෙන්වීම් ප්‍රකාරව ආයතනය පිළිබඳව හා වර්තමාන වර්ෂයේ සිට ඊළඟ වර්ෂ 04 දක්වා වූ වර්ෂ 05 කාලය තුල ඉටුකිරීමට නියමිත අරමුණු සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු සංයුක්ත සැලැස්මේ අඩංගු විය යුතුය. විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මගින් ක්‍රියාකාරී සැලැස්මේ හා සංයුක්ත සැලැස්මේ වර්තමාන තත්ත්වය හා ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සමාලෝචනය කිරීම සඳහා රු. 1,019,175 ක වියදමක් දරා වැඩමුළු දෙකක් පවත්වා තිබුණි. කෙසේවුවත් 2018 – 2022 කාලයට අදාලව සංයුක්ත සැලැස්මක් විශ්වවිද්‍යාලය මගින් පිළියෙල කර නොතිබුණි. | සෙනෙට් සභාවේ නිර්දේශය ප්‍රකාරව අංක PED/12 හා 2003 ජුනි 02 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා තත්ත්ව පාලන රාමුව (SLQF), කර්මාන්ත සමාලෝචන අත්පොත (IR), සහ වැඩසටහන් සමාලෝචන අත්පොත වැනි නව මිනුම් වලින් සමන්විත 2019 – 2023 කාලයට අදාල සංයුක්ත සැලැස්මේ කෙටුම්පත් වාර්තාව සභාපති විසින් සභාවට ඉදිරිපත් කර තිබේ. | 2018 – 2022 කාලයට අදාලව සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුයි. |

## 4.2 තිරසර සංවර්ධන අරමුණු

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/SP/SDG/17 හා 2017 අගෝස්තු 14 දිනැති තිරසර සංවර්ධනය සම්බන්ධ ලිපිය හා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව තම විෂය පථය යටතේ ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් සම්බන්ධව විශ්වවිද්‍යාලය දැනුවත් වී තිබුණි. කෙසේ වුවත් එම කාර්යයන් වලට අදාල තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට හා එම ඉලක්ක ලඟාකරගැනීමේ උපායමාර්ග හා ඉලක්ක ලඟාකරගැනීම මැන බැලීමේ දර්ශක ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය මෙම සංකල්පය සම්බන්ධව 2019 සිට 2023 දක්වා වූ උපායමාර්ග සැලැස්මට ඇතුලත් කර ඇති අතර එය දැනට සභාවේ සාකච්ඡා වෙමින් පවති. කරුණාකර 2.2 (ආ) හා (ඇ) ඡේද බලන්න. | තිරසර සංවර්ධන අරමුණු හා එම ඉලක්ක ලඟාකරගැනීම සඳහා ඉලක්ක සකස් කිරීමට හා මූලික කාර්යසාධන දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |